ඉතාලි

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි:**

- ඔබට වයස අවුරුදු 18 ට අඩු **නම්**
- ඔබ පැමිණියේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෙෝ දෙදෙනාම සමඟ නම්
- ඉතාලි හි රැකවරණය (ජාත්‍යන්තර ආරක්ෂාව ලෙසද හැඳින්වේ) සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය බව ඔබ සහ ඔබේ පවුලේ අය බලධාරීන්ට පැවසුවේ නම්


ඔබ සහ ඔබේ පවුල මෙම රට තුළ ආරක්ෂිතයි.

SINHALESE

යුරෝපයේ, වයස අවුරුදු 18 ට අඩු සෑම කෙනෙකු ම දරුවෙකු ලෙස සැලකෙන අතර **විශේෂ සහාය** ලබා ගැනීමේ අයිතිය ඇත.

## ඔබට උපකාර කළ හැක්කේ කාටද?

ඔබ රට තුළ රැඳී සිටින කාලය තුළ, බොහෝ වෘත්තිකයන්ට ඔබට සහ ඔබේ පවුලේ අයට උපකාර කළ හැකිය, උදාහරණයක් ලෙස ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට **පරිවර්තකයෙකුට** උපකාර කළ හැකිය. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ ඔබ සහ අනෙක් අය පවසන දේ ඒ ආකාරයෙන්ම පරිවර්තනය කිරීමයි.



## ඔබට සහ ඔබේ පවුලේ අයට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර ඔබට විවිධ ආකාරයේ සහාය සහ සේවාවන් ලැබෙනු ඇත. මෙය **පිළිගැනීම** ලෙස හැඳින්වේ.

දරුවෙකු ලෙස සහ රැකවරණය සොයන්නෙකු ලෙස ඔබට අයිතීන් ඇති අතර, ඔබ ගරු කළ යුතු වගකීම්ද ඇත. මේවා මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිළි කර ඇත.

මෙම විස්තර පත්‍රිකාවේ කොටස් ඔබට වැටහෙන්නේ නැත්නම් හෝ ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, කාර්ය මණ්ඩලයෙන් සහ ඔබේ දෙමාපියන්ගෙන් අසා දැනගන්න.

ඔබට අමතර තොරතුරු ඉදිරි දිනවල දී ලැබෙනු ඇත.

**ඔබේ තත්වය අනුව, ඔබට සහ ඔබේ පවුලේ අයට මේවා ලැබෙනු ඇත:**



- නිදා ගැනීමට ස්ථානයක්



- ආහාර



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ඇඳුම් පැළඳුම්



- ඔබේ පවුලට දෛනික වියදම් සඳහා මුදල් ද ලැබිය හැකිය.

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

**ඔබට අවශ්‍ය සෞඛ්‍ය සේවාව ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත.**

හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට ඔබට සිදු විය හැකි බව කාර්ය මණ්ඩලය ඔබට සහ ඔබේ පවුලේ අයට දැනුම් දෙනු ඇත.




## කාර්ය මණ්ඩලයට දන්වන්න:


- ඔබට අසනීප වී, තුවාල ලබා හෝ හදිසි වෛද්‍ය ආධාර අවශ්‍ය නම්
- ඔබට ආබාධයක් තිබේ නම්
- ඔබව අපයෝජනයට ලක් කර ඇත්නම්
- ඔබට යම් කෙනෙකු පිළිබඳ ව බියක් දැනුණේ හෝ දැනෙන්නේ නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම් ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට හෝ ඔබේ පවුලේ අයට වෙනත් ඕනෑම හේතුවක් නිසා සහාය අවශ්‍ය නම්

ඔබට බොහෝ විට දුකක්, කෝපයක්, බියක්, කනස්සල්ලක් දැනේ නම් හෝ ඔබට නිදා ගැනීමට අපහසු බවක් දැනේ නම්, ඔබට **මනෝ විද්‍යාඥයෙකු** සමඟ කතා කළ හැකිය.
ඔබට හෙදිය, වෛද්‍යවරයා, මනෝ විද්‍යාඥයා සහ කාර්ය මණ්ඩලය පිළිබඳව විශ්වාස තැබිය හැකිය. ඔබ පවසන කිසිවක් ඔබේ එකඟතාවයකින් තොරව ඔබේ දෙමාපියන් හැර වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත. එය එසේ නොවන්නේ ඔබේ හෝ වෙනත් කෙනෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇත්නම් පමණි.

## අධ්‍යාපනයට ඇති අයිතිය

දරුවෙකු ලෙස ඔබට අධ්‍යාපනයට සහ ඉගෙනීමට අයිතියක් ඇත. ඔබට ඉගෙනීමට, වර්ධනය වීමට සහ නව මිතුරන් ඇති කර ගැනීමට උපකාර කිරීම සඳහා අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් පිළිබඳව කාර්ය මණ්ඩලය ඔබට පවසනු ඇත.





## රැකියාවක නිරත වීමට ඇති අයිතිය





ඔබේ වයස සහ තත්වය අනුව, ඔබට අවශ්‍ය නම්, රැකියාවක නිරත වීමට ඔබට අවසර ලැබිය හැකිය. කාර්ය මණ්ඩලය ඔබට වැඩිදුර තොරතුරු ලබා දෙයි.

## ඔබ සහ ඔබේ පවුලේ අය නැවතී සිටින්නේ කොහේද?




බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ නැවතී සිටින ස්ථානය රඳා පවතින්නේ ඔබේ තත්වය මතයි.

ඔබ නැවතී සිටිය යුතු ස්ථානය කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත. **බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයේ පමණක් ඔබට සහාය සහ සේවා ලැබෙනු ඇත.**

**ඉතා කලාතුරකින්, තමන්ට අවශ්‍ය පරිදි පැමිණ යා නොහැකි මධ්‍යස්ථානයකට පවුල් යොමු කළ හැකිය. ඔබ මෙම තත්වයේ සිටී නම්, නීති උපදේශකයෙකු සහ කාර්ය මණ්ඩලය ඔබට සහාය වනු ඇත.**
නීති උපදේශකයෙකු යනු මේ රටේ නීතීන් දන්නා, ඔබේ තත්වය අධ්‍යයනය කළ හැකි සහ ඔබට සහාය විය හැකි පුද්ගලයෙකි.



**ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට පහත අයිතීන් ඇත:**



- **ඔබේ පවුලේ අය සමඟ නැවතී සිටීමට**



- ඔබේ **පවුලේ සාමාජිකයන් සිටින ස්ථානය ඔබ නොදන්නේ නම්**, ඔවුන් සමඟ **සන්නිවේදනය කිරීමට** සහ **ඔවුන්ව සොයා ගැනීමට** උපකාර ලබා ගන්න.

**ඔබට සුරක්ෂිතව සිටීමට අයිතිය ඇත. කිසිවෙකුට පහත දේ සඳහා ඉඩ නැත:**



ඔබට තර්ජනය කිරීමට



ඔබට අපහාස කිරීමට



ඔබට හානි සිදු කිරීමට

ඔවුන් කවුරුන් වුවත්, ආගන්තුකයෙකු හෝ ඔබ දන්නා කෙනෙකු වුවත්.
ඔබේ දෙමාපියන් හෝ කාර්ය මණ්ඩලය සමඟ ඔබට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඔබට ඒ පිළිබඳව කතා කළ හැකිය.

## ඔබට සහ ඔබේ පවුලේ අයට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද?

ඔබේ කතාව පැවසීමට ඇතැම් විට බියක් හා දුෂ්කර බවක් දැනුණ ද, ඔබ සත්‍යය පැවසීම සහ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ.
ඔබේ තත්වය පිළිබඳව දැනුවත් නම් කාර්ය මණ්ඩලයට ඔබට උපකාර කළ හැකිය.

ඔබ සහ ඔබේ පවුලේ අය ඉටු කළ යුතු වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.

- ✅ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති අනුගමනය කරන්න.
- ❌ බලධාරීන් ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන් පලා නොයන්න.
- ✅ කාර්ය මණ්ඩලය ඔබට පැහැදිළි කරන මේ රටේ නීති අනුගමනය කරන්න.

## ඔබ හෝ ඔබේ පවුලේ අය ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?

මෙය සිදුවුවහොත්, ඔබට කාර්ය මණ්ඩලය සමඟ විවෘතව කතා කර ඔබේ තත්වය පැහැදිළි කළ හැකිය. බලධාරීන් ඔබේ තත්ත්වය ඇගයීමට ලක් කර යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට තීරණය කළහොත් ඔබේ දෙමාපියන්ට දැනුම් දෙනු ඇත.



උදාහරණයක් ලෙස, ඔබේ පවුලේ සාමාජිකයෙකු බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, **එම පවුලේ සාමාජිකයාට අඩු සහයෝගයක් ලැබිය හැකිය.**



ඔබේ පවුලේ සාමාජිකයෙකු ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නේ නම්, **එම පවුලේ සාමාජිකයාට ලැබෙන සහයෝගය අහිමි විය හැකිය.** පොලිසිය කැඳවිය හැකිය.

ඔවුන්ට තවමත් ලැබෙන සහාය ඔවුන්ගේ පුද්ගලික තත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

**ඔබ සහ ඔබේ පවුලේ අය දැන් ඉතාලිය හි සිටින අතර, එය EU රටකි. EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ සහ ස්විට්සර්ලන්තය.


## රැකවරණය සඳහා අයදුම් කිරීම සහ EU+ රටවලට ගමන් කිරීම සඳහා වන නීති



- ඔබ සහ ඔබේ පවුලේ අය ඉතාලිය තුළ නැවතී සිටිය යුතු අතර අනෙකුත් එක් EU+ රටවලට හෝ පලා නොයා යුතුය.
- ඔබ පලා ගියහොත්, සෘණාත්මක ප්‍රතිවිපාක ඇති වේ, ඒ පිළිබඳ ව පසුව පැහැදිළි කෙරෙනු ඇත. උදාහරණයක් ලෙස, ඔබට අනෙක් රට තුළ දී අඩු සහායක් පිළිගැනීමේ දී ලැබෙනු ඇත.
- බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි ඔබේ රැකවරණ අයදුම්පත ලියාපදිංචි කළ යුතු බව මතක තබා ගන්න.
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ මෙම රටවලින් එකක් පමණි. හි බලධාරීන් මේ සඳහා වගකිව යුතු රට කුමක්ද යන්න ඔබට පවසනු ඇත.

මෙම ක්‍රියාපටිපාටි පිළිබඳව ඔබ වෙනම විස්තර පත්‍රිකාවලින් වැඩිදුර දැනගනු ඇත.

## ඔබ සහ ඔබේ පවුලේ අය EU+ රටවලින් එකකට පලා ගියහොත් කුමක් සිදුවේද?




**ඉතාලිය හි:**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**අනෙක් EU+ රටෙහි:**

- ඔබ හැර ගිය EU+ රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් මෙම තීරණය පිළිබඳ ව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට ඇතැම් ආකාරයේ සහායන් නොලැබෙනු ඇති අතර
- ඔබට රැකියාවක නිරත වීමට අවසර නොලැබෙනු ඇත.

ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ තත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

## බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට සහ ඔබේ පවුලේ අයට උපකාර කළ හැක්කේ කාටද?



ඔබට නීති උපදේශකයෙකුගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය.

ඔබට තොරතුරු සහ සහාය ලබා දිය හැකි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ද කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.




ඔබට ඕනෑම වේලාවක එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සම්බන්ධ කරගත හැකිය. තම රට හැර යාමට සිදු වන පුද්ගලයින් UNHCR විසින් ආරක්ෂා කෙරේ.

## මගේ සටහන්

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025